**G.O.B.A. Rest - කතරගම/අනුරාධපුර නිවාඩු නිකේතනයන්හි**

**නවාතැන් ලබා ගන්නා අමුත්තන් සඳහා වන උපදෙස්**

1. එක් එක් කාමර වල නවාතැන් ගත හැකි සංඛ්‍යාව පසුපිට සඳහන් කර ඇත. එම සංඛ්‍යාවට වඩා නවාතැන් ගැනීමට කැඳවා ගෙන නොපැමිණිය යුතු බව අවධාරණය කරමි. වෙන් කල දින ප.ව. 1.00 නිකේතනයට ඇතුල්විය හැකි අතර අවසන් දින පෙ.ව. 11.00ට පෙර ආපසු කාමර භාර දිය යුතු වේ.
2. කාමර හෝ යුගල නිවාස ලබා ගැනීම සඳහා ගෙවනු ලබන මුදල් කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. සාමාජිකත්වය සඳහා වන සහන ගාස්තු මත කාමර වෙන්කර ගත් සාමාජිකයින් නවාතැන් ගැනීම සඳහා පැමිණීම අත්‍යාවශ්‍ය වන අතර එසේ නොපැමිණෙන අවස්ථා වලදී ඒ සඳහා ඉදිරිපත් වන අයගෙන් සාමාජිකයන් නොවන පුද්ගලයන්ගෙන් අයකරන කාමර ගාස්තුව දක්වා වන ශේෂ මුදල අදාල ස්ථානයේදීම ගෙවිය යුතුය.
3. වෙන් කිරීම් වෙනස් කිරීමට එක් අවස්ථාවක් පමණක් ලබා දෙන අතර එය මුල් වෙන් කිරීමේ සිට වසරක් ඇතුලත දිනයක් විය යුතුය. වැඩ කරන දින 05 කට පෙර මුල් වෙන් කිරීමේ වෙනසක් සිදු කිරීමේදී අමතර ගාස්තු අය නොකරන අතර වැඩ කරන දින 05කට නො අඩු වන අවස්ථාවලදී පහත සඳහන් පරිදි අමතර ගාස්තු අය කරනු ලැබේ.
    a. වැඩ කරන දින 05 ක් ඇතුලත සිදු කරන වෙනස් කිරීමකදී ගෙවිය යුතු මුදලින් 25%
    b. වැඩ කරන දින 03ක් ඇතුලත සිදු කරන වෙනස් කිරීමකදී ගෙවිය යුතු මුදලින් 50%
4. නවාතැන් කරුවන්ට අවශ්‍ය ආහාර හා තේ නිවාඩු නිකේතනයෙන් කළමනාකරුට දන්වා සකස් කරවා ගත හැක. එසේ ලබා ගන්නා ආහාර සඳහා අපගේ මිල ගණන් අනුව නිකේතනයෙන් පිටත් වීමට පෙර නිකේතන කළමනාකරුට මුදල් ගෙවා ලදුපතක් ලබා ගත යුතුය.
5. කතරගම නිවාඩු නිකේතනයේ නවාතැන් ගනු ලබන (සාමාජිකයන්ට පමණක්) අවශ්‍ය වේ නම් ආහාර පිස ගැනීමට පහසුකම් සලසා ඇත. ඒ සඳහා අවශ්‍ය ගෑස්/ජලය/විදුලිය හා අනෙකුත් ආම්පන්න සඳහා එක් දිනකට එක් අයෙකු වෙනුවෙන් එක් වේලක් සඳහා රු. 50/- බැගින් අයකරනු ලබන අතර වේල් 2ක් සඳහා රු. 100/- බැගින් අයකරනු ලැබේ. (නවාතැන් ගාස්තු වලට අමතරව කරනු ලබන මෙම අයකිරීම් ගෑස්,ජලය, විදුලිය, ආම්පන්න සැපයීම පදනම් කරගෙන නියම කර ඇති බව කරුණාවෙන් සැලකුව මැනවි.)
6. ආහාර පිසීම කල යුත්තේ ඒ සඳහා වෙන් කර ඇති මුළුතැන්ගෙයි පමණි. කිසිදු හේතුවක් මත ද්විත්ව නිවාසයක හෝ කාමරයක් තුල හෝ ආහාර පිසීම නොකල යුතුයි.එසේම නවාතැන් ගන්නා ස්ථානය තුල විදුලි උපකරණ උපයෝගී කරගෙන අනවසර කටයුතු කිරීමටද ඉඩදෙනු නොලැබේ. තේ හෝ ආහාර පිස ගැනීම නිකේතන කාමර තුල සිදු කලහොත් රු.1,000/- ක දඩයක් නියම කරනු ඇත.
7. නවාතැන්කරුවන් වෙත නිකුත් කරනු ලබන කාමර වල යතුරු නවාතැනෙන් ඉවත්ව යන විට නිවාඩු නිකේතන කළමනාකරුට භාරදිය යුතු වේ. යම් හෙයකින් අදාල යතුර නැති වුවහොත් ඒ සඳහා රු. 500/-ක මුදලක් අයකරනු ලැබේ. (මෙම මුදල අයකරනුයේ දොරේ සම්පූර්ණ අගුල අළුතින් දැමීමට සිදු වන හෙයිනි) සාමාජිකයෙකු නොවන නවාතැන්කරුවකු නම් නිකේත පරිශ්‍රයෙන් පිටවීමට පෙර මෙම සියළු මුදල ගෙවිය යුතුය. තවද වෙනත් අලාභ හානියක් සඳහා කළමනාකරු නියම කරනු ලබන මුදල් ගෙවිය යුතු බව සැලකුව මැනවි.
8. නිකේතන පරිශ්‍රය තුල වාහන සේදීමට අවසර /ඉඩ දෙනු නොලැබේ.
9. නිකේතනයට රැගෙන එන ඔබේ බඩු බාහිරාදිය ප්‍රවේශම් කරගැනීම ඔබ සතු වගකීමකි. එම බඩු බාහිරාදිය සම්බන්ධයෙන් කළමනාකාරීත්වය කිසිදු වගකීමක් දරනු නොලැබේ.
10. නිකේතන පරිශ්‍රය තුල මත්පැන් පානය කිරීම හා ගෙන ඒම සපුරා තහනම්ය.
11. නවාතැන්කරුවන් අන්අයට හිරිහැර වන සේ හැසිරීම නොකල යුතුය.
12. නවාතැන්කරුවන් විසින් ආහාර සකස් කරන විට නවාතැන් ගෙන සිටින පිරිසට අමතරව වැඩිපුර ආහාර සකස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. (දාන හෝ දන්සැල් සඳහා ආහාර සකස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)
13. නවාතැන්කරුවන් රාත්‍රී 10.30 ට පෙර වෙන් කරගත් කාමර හෝ යුගල නිවාස වලට පැමිණිය යුතුය.

මෙම උපදෙස් උල්ලංඝනය කරමින් කටයුතු නොකල යුතු අතර, මෙම උපදෙස් වලට පටහැනිව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් නිවාඩු නිකේතන කළමනාකරුගේ වාර්තාව මත වැඩිදුරටත් ක්‍රියා කිරීමට සිදු වන බව අවධාරනය කරමි.

| | | |
|---|---|---|
| G.O.B.A. Rest - කතරගම | G.O.B.A. Rest -අනුරාධපුර | අ.කලේ/............................. |
| දු.ක :- 047 – 2236045 | දු.ක :- | ලේකම් හා ගණකාධිකාරි |
| | | ර.නි.ය.ස සංගමය |

ඉහත සඳහන් කරුණු වලට එකඟව කතරගම G.O.B.A. Rest හි නවාතැන් ගැනීමට එකඟ වෙමි.

| | | | |
|---|---|---|---|
| ................................ | ....................................... | ............................. | ....................................... |
| දුරකතන අංකය | නවාතැන්කරුගේ නම | දිනය | නවාතැන්කරුගේ අත්සන |